# අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය

## භාෂා පර්වර්තන සේවාව සඳහා මිල ගණන් කැඳවීම

අධිකරණ අමාත්‍යාංශය යටතේ පිහිටුවා ඇති අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට ලැබී ඇති ද්‍රවිඩ භාෂාවෙන් ලියන ලද පැමිණිලි 4500 ක් පමණ සිංහල හෝ ඉංග්‍රීසි භාෂාවට පරිවර්ථනය කරගැනීම සඳහා දිවුරුම් දුන් භාෂා පරිවර්ථකයින්ගෙන් මිල ගණන් කැඳවනු ලැබේ.

පරිවර්ථන කටයුතු සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 12/2003 (IV) අනුව එක් වචනයකට රු. 2.50 ක් බැගින් ගෙවීම් කරනු ලැබුවත් රහස්‍යබව ආරක්ෂා කරගැනීම, කොවිඩ්-19 වසංගතය හේතුකොටගෙන මුහුණ පෑමට සිදුවී ඇති විවිධ දුෂ්කරතා, ලියකියවිලිවල සඳහන් කරුණුවල පවතින සංවේදිතාවය සහ මෙම කාර්යය නිම කරවා ගැනීමට ඇති හදිසි අවශ්‍යතාවය වැනි කරුණු සැලකිල්ලට ගෙන මෙම භාෂා පරිවර්තනයන් සඳහා පමණක් දැනට මෙවැනි පරිවර්තන කටයුතු සඳහා ගෙවනු ලබන ගාස්තු වැඩිකර ගෙවීමට සලකා බලනු ලැබේ.

ඒ අනුව පහත සඳහන් කොන්දේසිවලට යටත්ව පරිවර්තන කරනු ලබන වචනයකට ඔබ ඉදිරිපත් කරන මිල ගණන් මුද්‍රා තබන ලද කවරයක බහා 2021.11.08 දින පෙරවරු 11.00 ට පෙර ලැබෙනසේ ලියාපදිංචි තැපෑලෙන්, **සභාපති, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය, අංක 408, ගාලු පාර, කොළඹ 03** යන ලිපිනයට එවන ලෙස ඉල්ලා සිටිනු ලැබේ. මිල ගණන් ඉදිරිපත් කරන ලිපි කවයේ ඉහළ වම් කෙළවරේ "**භාෂා පරිවර්තන සඳහා මිල ගණන් ඉදිරිපත් කිරීම**" වශයෙන් සඳහන් කළ යුතුය.

i. ඉහත ලිපිනයේ පිහිටි කාර්යාලයට පැමිණ භාෂා පරිවර්තන කටයුතු සිදු කළ යුතුය.

ii. භාෂා පරිවර්තන කටයුතු සඳහා ඔබ ඉදිරිපත් කරන මිල ගණන් පිළිගනු ලැබුවහොත් රජයේ කාර්යාල වේලාවන් තුළ ඉහත ලිපිනයේ පිහිටි කාර්යාලයට පැමිණ **භාෂා පරිවර්තන කටයුතු** සිදුකළ යුතුය.

iii. අදාල පැමිණිලි / ලිපිගොනුවල රහස්‍යභාවය සුරැකිය යුතු අතර, භාර දෙනු ලැබන ලියකියවිලි උපදෙස් දෙන පරිදි හැකි ඉක්මණින් පරිවර්තනය කොට භාරදිය යුතුය.

iv. කාර්යාලයට පැමිණීමේදී සහ එහි රැඳී සිටින කාලය තුළ අනිවාර්යයෙන්ම **සෞඛ්‍ය මාර්ග උපදේශ** අනුගමනය කළ යුතුය.

v. කාර්යාලයට පැමිණීම සඳහා ගමන් වියදම් ගෙවනු නොලැබේ.

මේ පිළිබඳ වැඩි විස්තර කාර්යාල වේලාවන් තුළ දුරකථන අංක 0112-301729 සහ අධ්‍යක්ෂ (මුදල්) ඩී.ජී. දිසානායක මහතාගෙන් 0773 464794 ලබාගත හැක.

**විනිසුරු උපාලි අබේරත්න,**
**(විශ්‍රාමික)**
**සභාපති,**
**අතුරුදහන් තැනැත්තන් පිළිබඳ කාර්යාලය.**

**2021.10.11**